# පෙරහැර බලමුද? පෙරහැරේ යමුද?

## උවිඳු කුරුකුලසූරිය

### ජනාධිපතිතුමනි ඔබේ නමට කැළලකි

වසර සියයකට පෙර රහස්‍ය තොරතුරු සැපයීමේ ඔත්තුකරුවෙකු යැයි චෝදනා නැගුණු යුදෙව් ප්‍රංශ හමුදා නිලධාරියෙකු වූ ඇල්ෆ්‍රඩ් ඩ්‍රෙෆස් වෙනුවෙන් පෙනී සිටීමෙන් විශිෂ්ට ප්‍රංශ නව කතාකරුවකු වූ එමිල් සෝලා විසි වන සියවසෙහි සිය මුද්‍රාව තැබුවේ ය. ප්‍රංශ සමූහාණ්ඩුවේ ජනාධිපති වෙත සෝලා (1898) ලියූ චූදිතයා නම් වූ සුප්‍රසිද්ධ ලිපියෙහි ඔහු මෙලෙස ලියුවේ ය.

'මේ අපකීර්තිමත් ඩෙෆ්‍රස් සිද්ධිය ඔබගේ නමට මොන තරම් කැළලක් ද? මෙය ප්‍රසිද්ධ කිරීමට මා ප්‍රතිඥාවක් දුන් හෙයින් මේ සිද්ධිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට බාර කෙරෙනු විනිසුරු සම්පූර්ණ සත්‍ය හෙළි නොකළහොත් මම සත්‍ය හෙළි කරමි. මෙම අපරාධයට හවුල් කරුවකු වීමට මා සූදානම් නැති හෙයින් ඒ ගැන කතා කිරීමේ වගකීමක් මට ඇත. තමා නොකළ වරදකට වද වේදනා විඳින අහිංසක මිනිසකුගේ අවතාරය රාත්‍රියෙහි නිරන්තරව මා හඹා එනු ඇත.'

**"තම වෘත්තිය හුදෙක් ආදායමක් ලබන්නට පමණක් නොවන බව තේරුම් ගැනීමට ඕනෑම ලේඛකයෙකු විචාරකයෙකු හෝ මාධ්‍යවේදියෙකු සෝලා ගේ මුහුණ දැකිය යුත්තේය."**

සෝලා අසාධාරණයක් වූ මිනිසෙකු වෙනුවෙන් නැගී සිටියේ ය. සත්‍ය වෙනුවෙන් නැගී සිටියේ ය. ඉවසීමක් ඇති රාජ්‍යයක් වෙනුවෙන් නැගී සිටියේ ය. ඔහු තම මාතෘ භූමිය වූ ප්‍රංශයේ කීර්තිය වෙනුවෙන් නැගී සිටියේ ය. ඔහු ඩ්‍රෙෆස් සිද්ධිය මහජන මතයක් සඳහා පූර්වාදර්ශයක් බවට පත් කළේ ය. අතීත ප්‍රංශය ප්‍රසිද්ධිය සම්බන්ධයෙන් කතා කළේ සාම්ප්‍රදායි අධිකාරවාදී කතෝලිකවාදී සහ පිටස්තරයින්ට විවෘත නොකෙරුනු ආකල්ප ඇතිව ය. එහෙත් ඩ්‍රෙෆස් නිදොස් යැයි සනාථ කිරීමට කතා කළ අනාගත ප්‍රංශය කතා කරනු ඇසුනේ ප්‍රජාතන්ත්‍රවාදී ලෞකිකවාදී සමූහාණ්ඩුවාදී ආකල්ප සහ ඉවසීමක් සමගින් ය. අනාගත ප්‍රංශය දිනා ගැනීමට හේතු වූයේ සෝලා ය.

බුද්ධිමතුන්ට සහ ලේඛකයින්ට සිය වසක් පැවති සම්මතයන් හා ආචාර ධර්ම සෝලා විසින් සකසන ලදී. තම වෘත්තිය හුදෙක් ආදායමක් ලබන්නට පමණක් නොවන බව තේරුම් ගැනීමට ඕනෑම ලේඛකයෙකු විචාරකයෙකු හෝ මාධ්‍යවේදියෙකු සෝලා ගේ මුහුණ දැකිය යුත්තේය. සෝලාට පින් සිදු වන්නට එළැඹුන සිය වස පුරා බුද්ධිමත් මාධ්‍යවේදියා දේශපාලනයේ නිරත වන්නේ බලය සඳහා නොව වැඩි දෙනාගේ යහපත පිණිසයැයි අවබෝධකොට ගත්තේ ය.

### රාසය උප්පරවැට්ටි සහ මාධ්‍ය

වසර 1992 ජූනි මාසය පෝලන්ත ඉතිහාසයේ දිගු ලේඛනයන්ගේ රාත්‍රිය ලෙස මතකයේ තැබෙන්නකි. එය දිගු පිහි සහිත රාත්‍රිය නමින් ඇඩොල්ෆ් හිට්ලර් ඔහුගේ විරුද්ධවාදීන් ඝාතනය කිරීම සිහිපත් කරමින් පෝලන්තයේ පටබැඳුනු කියමනකින් සැකසුනකි. වාසනාවකට පෝලන්තයේ සිදුවීම් මඳක් මෘදු විය. ඒකාධිපති පාලන කාලයේ ජනාධිපති, කතානායක, විදේශ කටයුතු ඇමති, මුදල් ඇමති සහ වෙනත් අයට අමතරව ඇතැම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කොමියුනිස්ට් රහස් පොලීසියේ ඒජන්තයින් යැයි පාර්ලිමේන්තු බහුතරය අහිමි වූ ආණ්ඩු පක්ෂය චෝදනා නැගුවේ ය. රාජ්‍ය ස්වයං විනාශයක් අභිමුවට තල්ලු විය. එය මාධ්‍යයටද තියුණු පරීක්ෂණයක් විය. අපද පුරවැසියන් ලෙස වගකීමකින් කටයුතු කළ යුතුව ඇතැයි මාධ්‍යවේදීන්ටද ඒත්තු ගියේ ය. ඉවත්ව යන ආණ්ඩුවේ අභ්‍යන්තර කටයුතු ඇමති විසින් කොමියුනිස්ට් රහස් පොලිසියේ තොරතුරු මත ඒජන්තයින් ලෙස ඉදිරිපත් කළ සැක කෙරුනු පුද්ගලයින්ගේ නාම ලේඛනය පල කිරීම අප ඒකමතිකව ප්‍රතික්ෂේප කෙරුවේ එබැවින් ය.

ප්‍රජාතන්ත්‍රවාදී විපක්ෂ ක්‍රියාකාරිකයෙකුට එරෙහිව ශාරීරිකව හෝ චරිතය වශයෙන් විනාශ කිරීමට පෘතග්ජනයෙකු විසින් සකස් කරන ලද තොරතුරු ලේඛන සත්‍ය තොරතුරු විය නොහැකි යැයි අපි තීන්දු කෙරුවෙමු. කිසියම් පුද්ගලයෙකු ගේ අතකොලුවක්වීම ඉතා පහසු යැයි මම පළමු වරට මෙම ආන්දෝලනාත්මක සිදුවීමෙන් ඉගෙන ගතිමි. රහස්‍ය උප්පරවැට්ටි වලට එරෙහිව සිටීම මාධ්‍ය සදාචාරය රැක ගැනීමේ කාරණයක් බවත් මම තේරුම් ගතිමි. එය මහජන සංවාදයේ පවිත්‍රතාව හා සම්බන්ධ වන්නකි.

තවත් අභ්‍යන්තර කටයුතු ඇමතිවරයෙකු අගමැති සෝවියට් ඔත්තු සේවය සඳහා රහස්‍ය තොරතුරු සැපයුවේයැයි චෝදනා කළ 1995 නොවැම්බරයේදී නැවත මම මේ කාරණය ගැන සිතුවෙමි. ඒකාධිපති පාලනය සමයේ අගමැතිවරයා කොමියුනිස්ට් ක්‍රියාකාරියෙකු විය. ඇමතිවරයා සහයෝගිතා ව්‍යාපාරයේ කැපී පෙනෙන ක්‍රියාකාරී නායකයෙකුද විය. මා විශ්වාස කළ යුත්තේ කවරෙකු ද? කිසි දිනක ඔත්තු සපයන්නෙකු නොවූ බවට සහතික වන පශ්චාත් කොමියුනිස්ට් අගමැතිවරයා ද? නැතිනම් මා දිගු කලක සිට දන සිටි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දියත් වූ රහස්‍ය ව්‍යාපාරයේ නායකයෙකු වූ අභ්‍යන්තර කටයුතු ඇමතිවරයාද?

**"ඊළගට මේ ආන්දෝලනයෙන් ඉගෙන ගත යුතු තව එක් පාඩමක් ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක රහස්‍ය සේවා විසින් රහසෙන් ලබා දෙන විශේෂ තොරතුරු යොදා ගැනීමේ පෙළඹවීමක් මාධ්‍යයට ඇත. එනමුත් මෙවැනි තොරතුරු එළියට දැමීම බාහිර සාධක මත මාධ්‍ය හැසිරවීමේ ප්‍රයත්නයන් ය. එමගින් කූට ලෙස ජන මතය හැසිරවීමේ උත්සාහයන් ය."**

මෑත කාලයේ මතු වූ මෙම අතිශය ආන්දෝලනාත්මක දේශපාලන සිදුවීමේ දී මාධ්‍ය සුපුරුදු පරිදි දෙපිළ බෙදුනි. ඇතැමුන් ඉතා අන්ධ ලෙස අභ්‍යන්තර ඇමතිවරයාගේ වචනය පිළිගත්හ. අනෙක් අය ඒත් අන්ධ ලෙස අගමැතිවරයාගේ වචනය පිළිගත්හ. එතැන් සිට ආණ්ඩුවේ රහස් තොරතුරු අංශයේ කාන්දු වීම් පටන් ගති. පශ්චාත් කොමියුනිස්ට්වාදී මාධ්‍ය වෙත අගමැතිගේ නිර්දෝෂීභාවය පිළිබඳව තොරතුරු ලැබෙන්නට විය. පශ්චාත් කොමියුනිස්ට් විරෝධ මාධ්‍යට අභ්‍යන්තර ඇමති ඉදිරිපත් කළ චෝදනාව නිවැරදි බවට තොරතුරු ලැබෙන්නට විය. මේ මහා ආන්දෝලනය වාසනාවකට පෝලන්ත ප්‍රජාතන්ත්‍රවාදය බිඳ නොදැමුවත් මාධ්‍ය දැඩි පරීක්ෂණයකට ලක් කළේ ය. දේශපාලන අරගලයකට සම්බන්ධවන රජයේ රහස්‍ය තොරතුරු සේවා විශ්වාස නොකිරීම පිළිබඳව එය හොඳ පාඩමක් විය. රහස්‍ය තොරතුරු සෝවියට් ඔත්තු සේවයට ලබාදීම පිළිබඳ අගමැති වෙත එල්ල කෙරුනු චෝදනාව පදනම් විරහිත කරුණු මත කෙරුනකියි අනාවරණය විය.

එතැන් සිට නිදහස් මාධ්‍යයේ හතුරා ලෙස මා සළකන්නේ තොරතුරු වල නිවැරදිභාවය වෙනුවට මතවාදයක් ඉස්මතු කරගැනීම ය. දෙවැන්න අන්ධභාවයයි. යන්තම් සොයා බැලීමකට පමණක් ඉන් සීමා වේ. ඊළගට මේ ආන්දෝලනයෙන් ඉගෙන ගත යුතු තව එක් පාඩමක් ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක රහස්‍ය සේවා විසින් රහසෙන් ලබා දෙන විශේෂ තොරතුරු යොදා ගැනීමේ පෙළඹවීමක් මාධ්‍යයට ඇත. එනමුත් මෙවැනි තොරතුරු එළියට දැමීම බාහිර සාධක මත මාධ්‍ය හැසිරවීමේ ප්‍රයත්නයන් ය. එමගින් කූට ලෙස ජන මතය හැසිරවීමේ උත්සාහයන් ය.

එවැනි සිදුවීම් සමග මගෙන් බොහෝ විට මිනිසුන් අසන්නේ ඔබ කොයි පැත්තේද මොන පක්ෂයටද නැතිනම් මොන සන්ධානයටද සහාය දෙන්නේ යනුවෙනි.

ඒ පෝලන්තයේ දිනපතා පුවත්පතක ප්‍රධාන සංස්කාරකවරයෙකු වන ඇඩම්ස් මිච්නික් ලියූ කොමියුනිස්ට්වාදයෙන් පසු මාධ්‍ය නම් ලිපියේ කොටසකි.

**පෙරහැරේ යමුද? පෙරහැර බලමුද?**

පිරිසක් පැහැර ගනු ලැබීය. සිංහල කොටින් ලෙස හංවඩු ගැසිණි. ඔවුන්ගේ පාපොච්චාරණ මාධ්‍ය වෙත නිකුත් කෙරිණි. අලුත්ම හෙළිදරව්ව නම් ඔවුන්ගේ නායකයින් ආණ්ඩුවේ බුද්ධි අංශ සාමාජිකයින් බවයි.

පරමේශ්වරී අත්අඩංගුවට ගැනිණි. කොටි ඔත්තුකාරියක ලෙස හංවඩු ගැසිණි. මේ දක්වා චෝදනා ගොනු නොකර රඳවාගෙන සිටිති. මව්බිම මූල්‍ය අධ්‍යක්ෂ දුෂ්‍යන්ත බස්නායක අත්අඩංගුවට ගැණිනි. කොටින්ට ආධාර දුන් බව ප්‍රචාරය කෙරිණි. මේ දක්වා චෝදනා ගොනු නොකර රඳවා තබා සිටිති.

රනිල් හා කොටි අතර ගිවිසුමක් ඇතැයි කියා එජාප ආණ්ඩුව පරාජය කළ මංගල ශ්‍රීපති දෙබැයන් ඇමතිකම් අහිමි වූ පසු කියන්නේ මහින්ද හා කොටි අතර ගිවිසුමක් ඇති බවයි.

මේ අප පසු කරමින් සිටින යුගයයි. අපට සෝලාලා නැත. අපට මිච්නික් ලා නැත. එහෙත් මේ මාධ්‍යය සියුම් පරීක්ෂණයකට භාජනය කෙරෙන කාලයකි. අප පෙරහැර නිරීක්ෂණය කරන්නන් මිස පෙරහැරේ යන්නන් නොවිය යුතුය.

තමා නොකළ වරදකට වදවේදනා විඳින අහිංසක මිනිසෙකුගේ අවතාරය රාත්‍රියෙහි නිරන්තරව අප හඹා එනු ඇත.